සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம் தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	වාණිජ හා ගිණුම්කරණ අධ්‍යයනය I -II	කාලය நேரம் Time: පැය 03යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාවය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

* පහත සඳහන් සිද්ධි ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

විද්‍යුත් වාහන අලුත්වැඩියාව පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇති පියල් සහ නිසල් "EV Tech" නමින් විද්‍යුත් වාහන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, ආරම්භක ප්‍රාග්ධනය ලෙස රු. 50 000 බැගින් යෙදවිය. ඩීසල් හා පෙට්‍රල් මිල ඉහළ යාම නිසා වර්තමානයේ විද්‍යුත් වාහන වලට වැඩි ඉල්ලුමක් පැවතීම "EV Tech" ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වී ඇත.

1. ඉහත සිද්ධියේ "EV Tech" ව්‍යාපාරය සපුරාලන මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
   (1) ආරක්ෂාව (2) ප්‍රවාහනය (3) විදුලි බලය (4) විනෝදය

2. "EV Tech" ව්‍යාපාරය නිෂ්පාදන ස්වභාවය අනුව,
   (1) භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාරයකි. (3) සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.
   (2) හවුල් ව්‍යාපාරයකි. (4) ලාභ ලබන ව්‍යාපාරයකි.

3. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් වාහන සඳහා වන ඉල්ලුම වැඩි වීම අයත්වන පරිසර සාධකය වන්නේ,
   (1) නෛතික පරිසරය (3) ආර්ථික පරිසරය
   (2) භෞතික පරිසරය (4) තාක්ෂණික පරිසරය

4. "EV Tech" ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන ක්‍රමය වනුයේ,
   (1) හවුල් ව්‍යාපාර (3) සේවා සැපයීමේ ව්‍යාපාර
   (2) තනි පුද්ගල ව්‍යාපාර (4) සංස්ථාපිත සමාගම

5. ඩීසල් සහ පෙට්‍රල් මිල ඉහළ යාම ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාහන අලෙවි කරන ව්‍යාපාර වලට,
   (1) තර්ජනයකි. (3) ශක්තියකි.
   (2) අවස්ථාවකි. (4) දුර්වලතාවයකි

Past Papers Wiki

* පහත සඳහන් සිද්ධි ඇසුරෙන් අංක 6 හා 7 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ක්‍රීඩා ඇදුම් නිර්මාණය කරන Waga Fit සමාගම තම නිෂ්පාදන වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා නාස්තිය අවම කිරීමේ අරමුණින් ලේසර් කටින් යන්ත්‍රයක් (Lasser cutting machine) මිලදි ගන්නා ලදි.

6. Waga Fit සමාගම මිලදී ගත් ලේසර් කටින් යන්ත්‍රය (Lasser cutting machine) අයත් වන නිෂ්පාදන සාධකය වන්නේ,
   (1) ශ්‍රමය
   (2) ව්‍යවසාය
   (3) ප්‍රාග්ධනය
   (4) ආයෝජනය

7. Waga Fit සමාගම තම නිෂ්පාදිතවල ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට උනන්දු වේ. නිෂ්පාදිතවල ගුණාත්මකභාවය බලාපොරොත්තු වන ඇල්මැති පාර්ශවය වන්නේ,
   (1) ගනුදෙනුකරුවන්
   (2) අයිතිකරුවන්
   (3) තරගකරුවන්
   (4) කළමනාකරුවන්

8. ව්‍යාපාර පරිසරයේ සිදු වූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.
   A - රජය අයවැය මගින් ආනයන සඳහා 25%ක බද්දක් පැනවීම.
   B - බැංකු පොලී අනුපාතිකය පහත හෙලීම.
   C - රුපියලට සාපේක්ෂව ඩොලරයේ වටිනාකම ඉහළ යාම.
   D - කොළඹ රත්නපුර අධිවේගී මාර්ගයක් තැනීමට මුදල් වෙන් කිරීම.

ඉහත සිදුවීම් අතරින් දේශපාලන පරිසර සාධක පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

(1) A හා C (2) A හා D (3) A හා B (4) B හා C

9. ව්‍යාපාරයකට .....(1)..... ශක්තීන් වන අතර .....(2)..... ව්‍යාපාරික අවස්ථාවකි.
   ඉහත ප්‍රකාශයේ (1) හා (2) ස්ථාන වලට අදාළ නිවැරදි පිළිතුර පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) බදු සහන ලබා දීම, ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම.
   (2) කළමනාකරුවන්ගේ අත්දැකීම්, තරගකරුවන් බිහිවීම.
   (3) නවීන තාක්ෂණය, පිළිගත් සන්නාමයක් තිබීම.
   (4) සුවිශේෂී නිෂ්පාදන ක්‍රම, නව නගර නිර්මාණය.

10. ඇල්මැති පාර්ශව වෙතින් ව්‍යාපාර ද විවිධ දායකත්ව අපේක්ෂා කරයි. පහත දායකත්ව අතුරින් සැපයුම්කරුවන්ගෙන් ව්‍යාපාර අපේක්ෂා කරන දායකත්වය වන්නේ,
    (1) ගුණාත්මක අමුද්‍රව්‍ය ලබාගැනීම.
    (2) නිවැරදි තීරණ ගැනීම.
    (3) ව්‍යාපාර සැලසුම් නිසිලෙස ක්‍රියාත්මක කිරීම.
    (4) ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය.

11. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) රජය පනවන අණ පනත් නීති රීති දේශපාලන පරිසරයට අයත් වේ.
    (2) ව්‍යාපාරයක භාණ්ඩ හා සේවා මිලදී ගන්නේ තරගකරුවෝය.
    (3) පාරිභෝගිකයන්ගේ ජීවන රටාව වෙනස්වීම ව්‍යාපාරයට ඇති තර්ජනයකි.
    (4) රටක ජාතික ආදායම එරට ජනතාව අතර බෙදීගොස් ඇති ආකාරය ආදායම් ව්‍යාප්තියයි.

12. X තීරුවේ ව්‍යාපාර සංවිධාන ද Y ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ ද ඇතුළත් වේ.

X තීරුව	Y තීරුව
A - හවුල් ව්‍යාපාර	1- වගකීම සීමිත වීම
B - තනි පුද්ගල ව්‍යාපාර	2- අයිතිය හා පාලනය රජය සතු වීම
C - රාජ්‍ය සංස්ථා	3- ව්‍යාපාරය ඇරඹීම සඳහා අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුවත් සිටිය යුතු වීම
D - සංස්ථාපිත සමාගම්	4- ලාභ හෝ අලාභ තනිව භුක්ති විඳීම

X හා Y තීරු ගැලපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A-3, B-2, C-1, D-4
(2) A-3, B-4, C-2, D-1
(3) A-1, B-4, C-3, D-2
(4) A-4, B-2, C-1, D-3

13. ඒක පුද්ගල ව්‍යාපාරයක් ව්‍යාපාර නාමය ලියාපදිංචි කල යුත්තේ,
    (1) අදාල පලාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේය.
    (2) 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේය.
    (3) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත යටතේය.
    (4) 1972 අංක 05 දරණ සමූපාකාර සමිති පනත යටතේය

14. පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කිරීමට යොදා ගන්නා නිර්ණායකයක් වන්නේ,
    (1) අයිතිකරුවන්ට ලැබෙන ලාභය
    (2) ගනුදෙනුකරුවන් සංඛ්‍යාව
    (3) ව්‍යාපාරයට ඇති වෙළෙඳපොළ කොටස
    (4) භාවිතා කරන අමුද්‍රව්‍ය ප්‍රමාණය

15. හවුල් ව්‍යාපාරයක පවත්නා ලිඛිත ගිවිසුම හඳුන්වන්නේ ,
    (1) හවුල් ඔප්පුව ලෙසය.
    (2) හවුල් ගිවිසුම ලෙසය.
    (3) හවුල් එකඟතාවය ලෙසය.
    (4) හවුල් ව්‍යවස්ථාව ලෙසය.

16. ව්‍යාපාරයක නෛතික පුද්ගලභාවය යනු,
    (1) ව්‍යාපාරයේ පැවැත්ම අඛණ්ඩ වීම ය.
    (2) ව්‍යාපාරය නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පෙනී සිටීමට ඇති හැකියාව ය.
    (3) අයිතිකරුවන්ගේ වගකීම සීමිත බව ය.
    (4) යම් පනතක් යටතේ ලියාපදිංචි කර තිබීම ය.

17. ගිණුම්කරණය යනු,
    (1) ඇල්මැති පාර්ශවයන්ට තොරතුරු සැපයීම ය.
    (2) ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම ය.
    (3) ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමේ ක්‍රියාවලියයි.
    (4) ව්‍යාපාරයේ මූල්‍ය තත්වය ගණනය කිරීමේ ක්‍රියාවලිය ය.

18. ව්‍යාපාර ගනුදෙනුවක් ලෙස හඳුන්වන්නේ,
    (1) රු.50 000ක භාණ්ඩ තොගයක් විකිණීම.
    (2) ව්‍යාපාරයක් සහ වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරුව.
    (3) ව්‍යාපාරයක් තවත් ව්‍යාපාරයක් සමග භාණ්ඩ හුවමාරුව.
    (4) රු. 50 000ක බැංකු ණයක් ලබා ගැනීම.

19. අනාගතෙය් දී ව්‍යාපාරයේ සම්පත් පිටතට ගලා යන්නේ,
    (1) ව්‍යාපාරයක් සතු වත්කම් නිසාය.
    (2) ව්‍යාපාරයක් සතු වගකීම් බෙරුම් කිරීමේ දී ය.
    (3) ව්‍යාපාරයක් සතු හිමිකම් වැඩි කර ගැනීමේ දී ය.
    (4) ඉහත සඳහන් කිසිවක් නොවේ ය.

20. පහත දැක්වෙන්නේ ගිණුම්කරණ සමීකරණයට අදාළ සංරචක හා ඊට අදාළ වටිනාකම් ය.

වත්කම් (රු.)	=	හිමිකම්(රු.)	+	වගකීම්(රු.)
500 000	=	300 000	+	200 000

    අ. රු. 100 000ක බැංකු ණයක් ගැනීම.
    ආ. රු. 25 000ක භාණ්ඩ තොගයක් රු.40 000කට විකිණීම.
    ඉහත සඳහන් සමීකරණය අ, ආ ගනුදෙනු සිදුවීමෙන් පසු කුමන ආකාරයට දිස්වේ ද?

	වත්කම් (රු.)	=	හිමිකම්(රු.)	+	වගකීම්(රු.)
(1)	600 000	=	300 000	+	300 000
(2)	625 000	=	325 000	+	300 000
(3)	640 000	=	340 000	+	300 000
(4)	615 000	=	315 000	+	300 000

21. ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන පහත දැක්වේ.

බැංකු ණය ගිණුම හර රු. 300 000
බැංකු ණයපොලී ගිණුම හර රු. 60 000
මුදල් ගිණුම රු. 360 000

ඉහත ගනුදෙනුව නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) රු. 360 000ක බැංකු ණය ගෙවීම
(2) රු. 360 000ක බැංකු ණයක් ලබා ගැනීම
(3) රු. 360 000ක් බැංකු ණය හා පොලී ගෙවීම
(4) රු. 300 000ක බැංකු ණය ගෙවීම

22. රු. 25 000ක භාණ්ඩ අත්පිට මුදලට විකිණූ අතර එය සඳහා රු. 25 000ක චෙක් පතක් ලැබුණි. මෙයට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් ගිණුම හර රු. 25 000
විකිණුම් ගිණුම රු. 25 000
(2) මුදල් ගිණුම හර රු. 25 000
බැංකු ගිණුම රු. 25 000
(3) බැංකු ගිණුම හර රු. 25 000
විකිණුම් ගිණුම රු. 25 000
(4) ණයගැති ගිණුම හර රු. 25 000
විකිණුම් ගිණුම රු. 25 000

23. පහත සඳහන් ගනුදෙනු සටහන් වන මූලික පොත් පිළිවෙලින් දක්වා ඇත්තේ,

A - අත්පිට විකුණුම් රු. 15 000
B - ණයට ගැනුම් රු. 10 000
C - දම්රෝ සමාගමෙන් ලී බඩු ගත්තා රු. 25 000
D - ණය හිමියන්ට චෙක්පතකින් ගෙව්වා රු. 15 000

(1) විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය
(2) මුදල් පොත, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, බැංකු ගිණුම
(3) විකුණුම් ජ'නලය, පොදු ජ'නලය, ගැනුම් ජ'නලය, බැංකු ගිණුම
(4) විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් පොත

24. බැංකු අයිරාව,

(1) ව්‍යාපාරයේ වත්කමකි.
(2) ව්‍යාපාරයේ වගකීමකි.
(3) ව්‍යාපාරයේ හිමිකමකි.
(4) ව්‍යාපාරයේ ආදායමකි.

25. ජ'නල වවුචරය අදාල කරගෙන ගනුදෙනු සටහන් කරන මූලික පොත වන්නේ,

(1) ගැනුම් ජ'නලය
(2) විකුණුම් ජ'නලය
(3) පොදු ජ'නලය
(4) බැංකු ගිණුම

26. බැංකු ප්‍රකාශයේ **හර** ට සටහන් වන අයිතමයක් වන්නේ,

(1) බැංකු ගාස්තු රු. 500
(2) චෙක් තැන්පතු රු. 5000
(3) සෘජු ප්‍රේෂණ රු. 2000
(4) මුදල් තැන්පතු රු. 10 000

27. 2025 ජනවාරි 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 40 000 කි. නමුත් එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය මීට වෙනස් විය. පහත දැක්වෙන කරුණු එයට හේතු විය.

* ණයගැති ප්‍රේෂණ රු. 5000
* බැංකු ගාස්තු රු. 1000
* ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2000
* තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ රු. 10 000

2025 ජනවාරි 31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වන්නේ,

(1) රු. 37 000
(2) රු. 42 000
(3) රු. 53 000
(4) රු. 32 000

Past Papers Wiki

28. බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී යොදා ගන්නා අයිතමයන් හැරුණු විට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දී යොදා ගන්නා අයිතමයන් පමණක් ඇතුලත් වරණය වන්නේ,

(1) ණයගැති ප්‍රේෂණ රු. 5000, බැංකු ගාස්තු රු. 1000, නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක් රු. 5000
(2) තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ රු. 10 000, බැංකු ගාස්තු රු. 1000,
(3) තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ රු. 5 000, නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක් රු. 2 000
(4) ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 6 000, සෘජු ණයගැති ප්‍රේෂණ රු. 3 000

* සසිදු ග්‍රැෆික් ආයතනයේ 2025.02.28 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 545ක් විය. පෙබරවාරි මස සුළු මුදල් වියදම් වල එකතුව රු. 2 455ක් විය.

29. ඉහත සඳහන් ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම වනුයේ,

(1) රු. 2 990
(2) රු. 2 455
(3) රු. 3 455
(4) රු. 3 000

30. ඉහත සඳහන් ව්‍යාපාරයේ මාර්තු මස සිට අග්‍රිමයේ වටිනාකම රු. 5 000ක් දක්වා වැඩි කලේ නම් මාර්තු 01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු වටිනාකම වන්නේ,

(1) රු. 1 455
(2) රු. 2 445
(3) රු. 3 455
(4) රු. 4 455

31. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක 2025.01.01 දිනට පැවති ගිණුම් ශේෂයන් ය.

ගොඩනැගිලි	රු. 500 000	බැංකු ණය	රු. 100 000
යන්ත්‍ර	රු. 50 000	ණය ගැතියන්	රු. 25 000
මෝටර් රථ	රු. 200 000	ණය හිමියන්	රු. 50 000
මුදල්	රු. 100 000		

ඉහත සඳහන් ව්‍යාපාරයේ 2025.01.01 දිනට හිමිකමේ වටිනාකම වන්නේ,

(1) රු. 725 000
(2) රු. 750 000
(3) රු. 825 000
(4) රු. 850 000

32. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකි.

A - රු. 100 000ක උපකරණ සැන්රෝ සමාගමෙන් මිලදී ගැනීම.
B - රු. 50 000ක භාණ්ඩ තොගයක් නිශාගෙන් මිලදී ගැනීම.
C - රු. 45 000ක භාණ්ඩ තොගයක් ණයට විකිණීම.
D - රු. 20 000ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
E - රු. 60 000ක භාණ්ඩ තොගයක් ලලිත්ට ණයට විකිණීම.

ඉහත ගනුදෙනු අතරින් ගැනුම් ජ'නලයේ හා විකුණුම් ජ'නලයේ සටහන් වන ගනුදෙනු පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) B, D හා C, E
(2) A, B හා B, E
(3) A, D හා C, E
(4) C, E හා B, D

PAST PAPERS WIKI

33. පොදු ජ'නලයේ ඇතුළත් වන ගනුදෙනුවක් වන්නේ,

(1) සුධීරට රු. 50 000ක භාණ්ඩ ණයට විකිණුම්.
(2) රු. 45 000ක අත්පිට විකිණුම්.
(3) වසන්තගෙන් රු. 25 000ක භාණ්ඩ තොගයක් ණයට ගැණුම්.
(4) ව්‍යාපාරයේ ප්‍රයෝජනයට රු. 75 000ක යන්ත්‍රයක් ණයට ගැණුම්.

Past Papers Wiki

34. ශේෂ පිරික්සුමක හර තීරුවේ තිබිය හැකි ගිණුම් ශේෂ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මුදල් ගිණුම, දුන් වට්ටම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම.
(2) බැංකු ගිණුම, විකුණුම් ගිණුම, ලද වට්ටම් ගිණුම.
(3) ණයගැති ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම, ගැනිලි ගිණුම.
(4) ලී බඩු ගිණුම, පොලී ආදායම් ගිණුම, විදුලි ගාස්තු ගිණුම.

35. ව්‍යාපාරයක ඇති ගිණුම් සියල්ල ඇතුළත් කර ඇත්තේ,
(1) ජ'නලයේ ය.
(2) ශේෂ පිරික්සුමේ ය.
(3) ලෙජරයේ ය.
(4) හිමිකරුගෙ පොතේ ය.

36. රු. 50 000ක වැටුප් ගිණුමේ ශේෂය රු. 5 000ක් ලෙස අඩුවෙන් එකතු කර තිබීම කුමන අවස්ථාවක දී සිදුවිය හැකි වරදක් ද?
(1) මූලික සටහන් පොත්වල ගනුදෙනු සටහන් කිරීමේ දී.
(2) මූලික සටහන් පොත්වලින් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී.
(3) ලෙජර ගිණුම් තුලනය කිරීමේ දී.
(4) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී.

37. රු. 25 000ක ණයට විකුණුම්, ගිණුම් වල දෙවරක් සටහන් වීම නිසා,
(1) ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ වල වෙනසක් ඇති නොවේ.
(2) ශේෂ පිරික්සුමේ හර ශේෂ වල එකතුව වැඩි වේ.
(3) ශේෂ පිරික්සුමේ හර ශේෂ වල එකතුව වැඩි වේ.
(4) ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ වල එකතුව අඩු වේ.

38. රු. 5 000ක දුරකථන ගාස්තු ගෙවීම දුරකථන ගාස්තු ගිණුමේ පමණක් සටහන් කර තැබීම,
(1) ගනුදෙනුවක් සම්පූර්ණයෙන් ම පොත් වලින් මග හැරීමේ වරදකි.
(2) ගනුදෙනුවක වටිනාකම එක් ගිණුමක පමණක් සටහන් වීමේ වරදකි.
(3) ගනුදෙනුවක වටිනාකම මූලික පොත්වල වැරදියට සටහන් වීමකි.
(4) ගනුදෙනුවක වටිනාකම මූලික පොත්වල සටහන් වී නොතිබීමේ වරදකි.

39. පහත දැක්වෙන වැරදි අතරින් ශේෂ පිරික්සුමේ වෙනසක් ඇති කරන වරදක් වන්නේ,
(1) රු. 5 000ක රක්ෂණ ගාස්තු ගෙවීම මුදල් පොතේ හරට සටහන් කිරීම.
(2) රු. 10 000ක චේතන ගෙවීම ගිණුම්වල දෙවරක් සටහන් කිරීම.
(3) රු. 25 000ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් කිරීම සම්පූර්ණයෙන් ම මග හැරීම.
(4) රු. 10 000ක කුලී ගෙවීම රු. 1 000ක් ලෙස ගිණුම්ගත කිරීම.

40. .....(A)..... හර ශේෂ එකතුව හා බැර ශේෂ එකතුව අතර .....(B)..... ඇති වූ විට ගිණුම්කරණ .....(C)..... සොයා ඒවා නිවැරදි කරන තෙක් එම වෙනස තාවකාලික ව .....(D)..... සටහන් කරනු ලබයි.
ඉහත A, B, C හා D යන හිස්තැන් වලට අදාල නිවැරදි පිළිතුර වන්නේ,
(1) ලෙජරයේ , වෙනසක්, සටහන්, ශේෂ පිරික්සුමේ
(2) ශේෂ පිරික්සුමේ, වෙනසක්, වැරදි, අවිනිශ්චිත ගිණුමේ
(3) පොදු ජ'නලයේ, වෙනසක්, වැරදි, ශේෂ පිරික්සුමේ
(4) ගිණුම්වල, වෙනසක්, එකතුව, පොදු ජ'නලයේ

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10 ශ්‍රේණිය	වාහපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II	

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

උපදෙස් -

පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) පහත සිද්ධිය ඇසුරෙන් (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අයාන් වෘත්තියෙන් සත්ව ගොවිපොලක් පවත්වා ගෙන යන ව්‍යාපාරිකයෙකි. පියා විසින් ලබාදුන් රු.500 000 ක් වටිනා කිරි එළදෙනුන් යොදාගෙන 2025.01.01 දින **ඉසුරු කිරි** නිශ්පාදන නමින් ගුණත්වයෙන් යුත් කිරි නිශ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

අයාන් කුඩා කල ලද ඇත්දැකීම් හා සත්වපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම ගොවිපොල සාර්ථක වීමට හේතුවක් විය. සත්ව ගොවිපොලට අවශ්‍ය රු.50 000 ක් වටිනා ගොඩනැගිල්ලක් හා රු.25 000 ක් වූ උපකරණ මෙදිනම පියා විසින් සපයන ලදි. කිරි දෙනුන්ගෙන් ලබා ගන්නා කිරි වලින් කොටසක් සි/ස මිල්කෝ සමාගමට අලෙවි කරනු ලැබේ. ඉතිරිය යෝගට්,මුදවපු කිරි නිශ්පාදනය සිදු කරන ගොවිපලේ කටයුතු සිදුකිරීම සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදි. එදිනම ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද රු.1 200 000 ක ණය මුදල යොදවා ත්‍රිවිලරයක් මිලදි ගන්නා ලදි.2025.01.15 දින රු.25 000ක් යොදවා බැංකු ජංගම ගිණුමක් ආරම්භ කරන ලදි.

2025.01.31න් අවසන් මාසය තුල පහත සඳහන් ගනුදෙනු සිදු විය.

ආදායම් :-	මුදවපු කිරි විකුණුම්	80 000
	යෝගට් අලෙවිය	34 000
	සි/ස මිල්කෝ සමාගමෙන් ලැබීම්	75 000
	ණයට විකුණුම්	36 000
වියදම්: :-	වැටුප් ගෙවීම	45 000
	විදුලිය	5 000
	ගොඩනැගිලි අළුත්වැඩියා	12 000
	සත්ව ආහාර	8 000
	මැටි බඳුන්	15 000
	යෝගට් ඇසුරුම්	4 000
	ප්‍රවාහන වියදම්	3 000

i) (අ) මෙම ව්‍යාපාරය විසින් ඉටුකරනු ලබන අවශ්‍යතාවය හා වුවමනාව කුමක්ද ?
(ආ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් 02 ක් ලියන්න. (ලකුණු02)

Past Papers Wiki

ii) (අ) මෙම ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයටද ? (ලකුණු02)

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ 02ක් ලියන්න.

iii) (අ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්වයන් 02ක් නම් කර ඔවුන් ගේ අරමුණ බැගින් දක්වන්න.

(ආ) සිද්ධියට අදාලව දැකිය හැකි ව්‍යාපාර සංවිධාන 02ක් දක්වන්න. (ලකුණු02)

iv) (අ) මෙම සිද්ධියට අදාලව නිශ්පාදන සාධක 02ක් උදාහරන සහිතව දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ අරමුණු 02ක් නම් කරන්න. (ලකුණු02)

v). 2025.01.01 දිනට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරනය දක්වන්න. (ලකුණු02)

vi). ජංගම ගිණුමක් ආරම්භ කිරීම සම්බන්ධ ද්විත්ව සටහන වටිනාකම සහිතව ලියා දක්වන්න. (ලකුණු02)

vii). මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම වත්කමක් සහ ජංගම නොවන වත්කමක් දක්වන්න. (ලකුණු02)

viii) 2025.01.31 දිනට මුදල් ශේෂය කොපමණද? (ලකුණු02)

ix). මෙම ව්‍යාපාරයේ මූලික සටහන් පොත් 02 ක් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු02)

x). 2025.01.31 දිනට හිමිකම කොපමණද ? (ලකුණු02)

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

2.) i) 2026 වසරේ සිට ආරම්භ කිරීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව පෙළපොත වෙනුවට මොඩියුල සිසුන්ට හදුන්වා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

මෙහි සඳහන් අවශ්‍යතාවය හා වුවමනාව පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු02)

ii). පහත සඳහන් පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

(අ) ඕනෑම ව්‍යාපාරයක අරමුණ විය යුත්තේ ලාභ ඉපයීමයි. (.....)

(ආ) ආහාර, ඇඳුම්,නිවාස මූලික අවශ්‍යතා ලෙස හඳුන්වයි. (.....)

(ඉ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර පමණක් මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලයි (.....)

(ඊ) අවශ්‍යතා හා වුවමනා පදනම් කර ගත්විවිධ ව්‍යාපාරිකයින් බිහි වේ (.....) (ල.1/2x4 =2)

iii). සුමේධ තම මිතුරෙකු වූ ලහිරු ආරම්භ කළ ලී කැටයම් නිෂ්පාදන ව්‍යාපාරයකට තමා ඉතිරි කරගත් මුදලක් ප්‍රාග්ධනය ලෙස යොදවන ලදී.

(අ) සුමේධ ඉහත සඳහන් ව්‍යාපරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතු 2ක් සඳහන් කරන්න.

(ආ) ඉහත ව්‍යාපාරයට ගනුදෙනු කරුවන් උනන්දුවක් දැක්වීමට හේතු 2ක් සඳහන් කරන්න. (ල.02)

iv). පාරින්ද විසින් බිලිං ආහාර විජලන යන්ත්‍රයක් මගින් විජලනය කර විදේශ රටවලට අපනයනය කිරීමේ ව්‍යාපාරයක් ඉතා සාර්ථක ලෙස කරගෙන යනු ලබයි.

(අ)මෙම ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක 02ක් නිදසුන් සහිතව ලියන්න. (ල.02)

3). i) (අ) ව්‍යාපාරයක කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එම කොටස් දෙක නම් කරන්න.

(ආ) ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ආර්ථික පරිසර සාධක දෙකක් නම් කරන්න. (ල.02)

ii). පහත සඳහන් ප්‍රකාශන සත්‍යයද අසත්‍යද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක් අනුගමනය කරන්න සුවිශේෂී වූ නිෂ්පාදන ක්‍රම ව්‍යාපාරයකට අවස්ථාවකි. (.....)
(ආ) රටක ඉතුරුම් වර්ධනය වීම ආයෝජන වර්ධනය වීමට හේතු වේ. (.....)
(ඉ) ව්‍යාපාරයකට ඇති කරන යහපත් හෝ අයහපත් බලපෑම් හඳුනා ගැනීමට ව්‍යාපාරික පරිසරය අධ්‍යයනය කළ යුතුය. (.....)
(ඊ) ව්‍යාපාරයක පැවැත්ම රඳා පවතින ප්‍රධාන පාර්ශ්ව වන්නේ අයිතිකරුවන්ය . (.....)

(ල.2)

iii). සාර්ථක කෝපි වගාවක හිමිකරුවකු වන නිශාන් තම නිර්මාණශීලීත්වය යොදා ගනිමින් පානයක් ලෙස භාවිත කළ හැකි "කෝපි ටැබ්ලට්" එකක් නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කරයි. ඔහුගේ මෙම නිෂ්පාදන සඳහා විදේශකයින්ගෙන් ඉතා ඉහළ ඉල්ලුමක් පවතී.

ඉහත ව්‍යාපාරය ඇසුරෙන් ශක්තියක් හා අවස්ථාවක් ලියන්න. (ල.02)

iv). දේශීය ව්‍යාපාර වර්ධනය සඳහා ගෝලීය පරිසරයෙන් ඇතිවන හිතකර බලපෑම් 2ක් ලියන්න. (ල.02)

4). i). ස්වේච්ඡාවෙන් එකට එකතු වී සාමූහික අයිතියක් භුක්ති විඳින පුද්ගල කණ්ඩායමක පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමේ අරමුණින් සමූපකාර සමිති බිහිව ඇත.

(අ) සමූපකාර සමිතිවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 02 ක් නම් කරන්න.
(ආ) සමූපකාර සමිතිවල වාසියක් හා අවාසියක් ලියන්න. (ල.02)

ii). පහත සඳහන් ප්‍රකාශ සත්‍යය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධනයට ලැබෙන ප්‍රතිලාභය ලාභාංශ වේ. (.....)
(ආ) සී/ස සමාගමක කොටස්කරුවන්ගේ වගකීම ඔවුන් සමාගමේ ආයෝජනය කළ ප්‍රාග්ධනයට සමාන වේ. (.....)

(ඉ) සාමාජික සුභසාධනය අරමුණු කරගත් සමති සංවිධාන පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි. (.....)

(ඊ) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හඳුන්වා දෙන පරිදි සේවක සංඛ්‍යාව 20 ට අඩු ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස හඳුන්වයි. (.....)

(ල.02)

Iii). (අ)පහත සඳහන් ව්‍යාපාර අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

1. කෘෂි රක්ෂණ මණ්ඩලය -
2. සුමිහිරි බේකර්ස් -

(ආ) ඉහත (අ) හි ඔබ සඳහන් කළ ව්‍යාපාර සංවිධාන වර්ග වල වාසියක් හා අවාසියක් ලියන්න. (ල.02)

iv).ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් ගේ සුභ සාධකසංගමය පවත්වාගෙන යනු ලබන “Our Food” ආපනශාලාවේ සුමිහිරි බේකර්ස් සමාගමේ බේකරි නිෂ්පාදන අලෙවි කරයි.

පහත A, B, C හා D සඳහා ඉහත සිද්ධියේ සඳහන් නිදසුන බැගින් ලියන්න.

A - සේවා සැපයීමේ ව්‍යාපාර
B - සමිති සංවිධාන
C - ලාභ අරමුණු කරගත් ව්‍යාපාර
D - රාජ්‍ය අංශයේ ව්‍යාපාර (ල.02)

11 කොටස-ගිණුම්කරණය (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

5. i). ගිණුම්කරණයේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල.02)

ii).වත්කමක ලක්ෂණ දෙකක් දක්වන්න. (ල.02)

iii).ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරයේ පහත දැක්වේ.

	වත්කම්			හිමිකම	වගකීම්
	තොගය	ණයගැතියෝ	මුදල්		බැංකු ණය
අ			+900 000	+900 000	
ආ		-20 000	+20 000		
ඉ	-10 000	+20 000		+10 000	
ඊ				+50 000	-50 000

ඉහත එක් එක් ගනුදෙනුව අගයන් සහිතව දක්වන්න. (ල.04)

iv).පහත එක් එක් ගණුදෙනුව ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(අ) රුපියල් 30 000 ක භාණ්ඩ තොග ණයට විකිණීම.
(ආ) අයිතිකරුගේ පෞද්ගලික ජීවිත රක්ෂණ වාරිකය වූ රුපියල් 10 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.(ල.02)

6. i)
(අ) ඉන්වොයිසියක සඳහන් කරණ කරුණු 4 ක් දක්වන්න. (ල.02)

ii). පහත වගුව සම්පූර්ණ කරන්න.

ගනුදෙනුව	මූලාශ්‍ර ලේඛනය	මූලික සටහන් පොත
1. රුපියල් 5000ක තොග ණයට විකිණීම	.....	.....
2. ව්‍යාපාරයේ ප්‍රයෝජනයට රුපියල් 50000 ලීබඩු මිලදී ගැනීම	.....	.....

(ල.02)

Past Papers Wiki

iii). සහන ව්‍යාපාරයේ 2025 මාර්තු මාසයේ විකුණුම් වලට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ .

- 2025.03.03 දින ඉන්වොයිස් අංක 230 යටතේ රශ්මිට එකක් රුපියල් 1500 බැගින් ළමා ඇඳුම් 20 ක් විකිණීම (අඩු කළ වෙළෙඳ වට්ටම් 5%)
- 2025.03.15 දින විශ්මිට, එකක් රුපියල් 2000 බැගින් කමිස 6 ක් අත්පිට මුදලට විකිණීම.
- 2025.03.20 දින ඉන්වොයිස් අංක 232 තෂ්මිට එකක් රුපියල් 5000 ක් බැගින් සාරි 10 ක් විකිණීම.

අවශ්‍ය වන්නේ,

1.විකුණුම් ජර්නලය
2.අදාල ලෙජර් ගිණුම් (ල.04)

iv). මිහිනිගේ ව්‍යාපාරය 2025.1.1 දින ආරම්භ කළ අතර එම මස මුදල් ගනුදෙනු පහත දැක්වේ.

දිනය	ල.අ.	ව.අ.	ගනුදෙනුව
01.01	01		මිහිනි ප්‍රාග්ධනය ලෙස රුපියල් 500 000 ක් යෙදීම.
01.03	02		රු. 200 000 ක් බැංකු ණය ලබා ගැනීම.
01.09		001	අත්පිට ගැනුම් රු.50 000
01.12	03		අත්පිට විකුණුම් රුපියල් 12000
01.23		002	රුපියල් 3000 විදුලි බිල ගෙවීම

අවශ්‍ය වන්නේ,

(1) මුදල පොත (ල.04)

7) i) බැංකු ප්‍රකාශනය යනු කුමක්ද ? (ල.02)

ii) පෙලි බැංකු සේවාව මඟින් ව්‍යාපාරිකයෙකුට ඉටුකර ගත හැකි කාරයන් දෙකක් දක්වන්න. (ල.02)

iii) සෙව්වන්දිගේ ව්‍යාපාරයේ 2025 මාර්තු මාසයේ සඳහා පිළියෙල කර බැංකු ගිණුම අනුව වාසිදායක ශේෂයේ රුපියල් 42 000ක් විය එය දින එදිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂයට සමාන නොවීය වෙනසට හේතු පහත පරිදි අනාවරණය කරගෙන ඇත.

1. තැන්පත් කළ නමුත් 2025 .3.31 වන විටත් නිෂ්කාශනය නොවූ චෙක්,
   චෙක් අංක 521350 - රු.4 200
2. නිකුත් කළ නමුත් 255යි 3.31 වන විටත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්,
   චෙක් අංක 100101 - රු.12 000
3. බැංකු ප්‍රකාශනය සඳහන් පහත අයිතම ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සඳහන්ව නැත.
   ණයගැති ප්‍රේෂණ - රු.8 300 බැංකු ගාස්තු - රු.500

අවශ්‍ය වන්නේ,

අ) බැංකු ගිණුම සංශෝධනය කිරීම.

ආ) 2025.3.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කිරීම. (ල.04)

iv). (අ) නලිනගේ ව්‍යාපාරයේ ගිණුම් සහායක විසින් 2025.5.31 දිනට පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රුපියල් 583 000 ක වූ අතර බැර තීරුවේ එකතුව රුපියල් 633 000 ක් විය.
මේ අනුව අවිනිශ්චිත ගිණුමකට මාරු කළ යුතු අගය සහ එය එම ගිණුමෙහි සටහන් කළ යුත්තේ කුමන පැත්තේදැයි දක්වන්න.

ආ) ව්‍යාපාරයක් විසින් ගිණුම් තැබීමේ දී සිදු වී ඇති පහත එක් එක් වැරදි නිවරදි කිරීම ට අදාල ජ නල් සටහන් ලියා දක්වන්න.

1. රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වලින් මගහැරීම.
2. ගෙවූ ණය පොලී රුපියල් 2000 සටහන් කර ඇත්තේ මුදල් පොතේ පමණි. (ල.04)

Past Papers Wiki



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library